<u>නිවිතිගල ප්‍රාදේශීය සභාව</u>

<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 24 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 20 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නිවිතිගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දායක විශ්‍රාම වැටුප් අරමුල සඳහා රු. 640,975 ක් සහ ආදාහන උත්සවයක් වෙනුවෙන් ද්‍රව්‍ය සැපයීම සඳහා වූ රු. 40,000 සමඟ එකතුව රු. 680,975 ක් ණයහිමියන් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) විවිධ වැය විෂයයන් 09 ක් සම්බන්ධයෙන් වැය ලෙජරය හා මූල්‍ය ප්‍රකාශන අතර රු. 423,138 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) පොදු වෙළඳපල ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදල මඟින් ලබා ගත් ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු. 61,495 ක හිඟ පොලිය වෙනුවෙන් ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබූ රු. 326,000 ක ආදායම් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ සටහන් නොකිරීම හේතුවෙන් ආදායම් හා වියදම් ගිණුම අනුව වර්ෂය සඳහා අතිරික්තය හා මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය අනුව එකී ශේෂය අතර, රු. 326,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 05 කට අදාලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ වෙනස රු. 9,491,711 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට සභාව සතු ස්ථිර තැන්පත් ආයෝජන වටිනාකම රු. 1,748,344 ක් වුවද, ස්ථාවර තැන්පතු පිළිබඳ බැංකු සහතිකය අනුව එම අගය රු. 528,650 ක්වූ බැවින් ආයෝජන වටිනාකම රු. 1,219,694 ක් සඳහා වන තැන්පතු සහතික හෝ බැංකු මඟින් සනාථ කිරීමේ සහතික විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමි ශේෂය රු. 9,795,313 ක් වුවද, ණයහිමි ලේඛණය අනුව එකී ශේෂය රු. 8,510,638 ක් විය. ඒ අනුව රු. 1,284,675 ක ණයහිමියන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | | අනුකූල නොවීම්. |
|---|---|---|
| | ----------------------------------------- | ------------------ |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| | 132 (ඒ) වගන්තිය | ප්‍රජා පිළිගැනීම හෝ පොදු වැදගත් කටයුත්තක් හෝ සිද්ධියක් හෝ අවස්ථාවක් පිළිබඳව හෝ වියදම් සඳහා එක් වර්ෂයකට රු. 1,000 ඉක්මවන වියදම් සඳහා අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, ඊට පටහැනිව අවස්ථා 07 කදී එකතුව රු. 54,556 ක් වියදම් දරා තිබුණි. |
| (ආ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත යටතේ සාදන ලද 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතී | |
| (I) | රීතී 161 | ආදායම් හා වියදම් ගිණුම් වලට අදාල සියළු ලෙජර් ගිණුම් පවත්වා නොතිබුණි. |
| (II) | රීතී 177 | රු. 5,000 ඉක්මවන ද්‍රව්‍ය හෝ භාණ්ඩ සැපයීම සඳහා මිල ගණන් කැඳවා ටෙන්ඩර් මණ්ඩලයක් මඟින් තීරණය කර අදාල මිලදී ගැනීම් සිදුකල යුතු වුවත්, එම රීතී නොසලකා රු. 173,502 ක් වැයකර පුස්තකාල පොත් මිලදී ගැනීම හා රු. 147,190 ක් වැයකර අළුත්වැඩියා සිදුකර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) | මුදල් රෙගුලාසි අංක 371 | 2010 පෙබරවාරි 09 දින ලබා දී තිබූ රු. 200,000 ක අත්තිකාරම් මුදල පියවා නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි අංක 571 | 1993 වර්ෂයේ සිට ඉදිරියට ගෙනඑනු ලබන රු. 342,831 ක්වූ තැන්පතු ශේෂ 51 ක් සම්බන්ධයෙන් අදාල රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (111) | මුදල් රෙගුලාසි අංක 1645 | සභාව සතු සියළුම වාහන වලට අදාලව විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | නාගරික සංවර්ධන හා පූජා භූමි අමාත්‍යාංශයේ ලේකම්ගේ 2009 අප්‍රේල් 17 වන දිනැති අංක 1597/08 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ V වන උපලේඛණය | සභා බල ප්‍රදේශය තුල පවතින දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධයෙන් නිසි සමීක්ෂණයක් සිදුකර නියමිත ගාස්තු අයකල යුතු වුවත්, විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 මැයි මස වනවිටත් එසේ සිදු කර නොතිබුණි. |
| (ඉ) | විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන චක්‍රලේඛය | ග්‍රාමීය ප්‍රදේශයන්හි "ඒ" ශ්‍රේණියේ මාර්ග වල ව්‍යාපාරික ප්‍රදේශ තුල විදුලි කණුවල වොට් 110 නොඉක්මවන අධිපීඩන සෝඩියම් වේපර් ලාම්පු යෙදිය හැකි වුවත්, ඒ පිළිබඳව නොසලකා සභාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී රු. 119,200 ක් වටිනාකමැති වොට් 250 අධිපීඩන වීජී පහන් සෙට් 08 ක් මිලදී ගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,130,970 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 494,779 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

2013 වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් ඌණතාවය රු. 494,779 ක් වුවද, 2014 වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු. 3,130,970 ක් වූයෙන් වර්ෂය තුල මූල්‍ය ප්‍රතිඵලය සියයට 733 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. මෙයට හේතු වී ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දි වරිපනම් බදු, කුලී ආදායම්, බලපත්‍ර ගාස්තු, වෙනත් ආදායම් හා වෙනත් ආධාර වැඩිවීම වේ.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 1,583 | 2,212 | 1,473 |
| බදු කුලී | 3,454 | 3,289 | 138 |
| බලපත්‍ර ගාස්තු | 1,077 | 305 | 1.5 |
| වෙනත් ආදායම් | 8,592 | 26,901 | 7,660 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

-----------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් හා රැස්කල ආදායම සමඟ සැසඳීමේදී කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආධාර වල ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල අදායමෙහි පිළිවෙලින් සියයට 12, සියයට 72 හා සියයට 32 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු
------------------

2014 දෙසැම්බර් 31 දිනට රු. 1,341,168 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවති අතර, ඉන් වර්ෂ 05 ට වැඩි හිඟ ශේෂය රු. 451,407 ක් විය.

2.3.4 අක්කර බදු

-------------------

2014 දෙසැම්බර් 31 දිනට රු. 84,720 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවති අතර, ඉන් වර්ෂ 05 ට වැඩි ශේෂය රු. 34,772 ක් විය.

2.3.5 බදු කුලී
----------

2013 වර්ෂයේදී කුකුල් මස් කඩය ටෙන්ඩර් නොකර මාසිකව රු. 48,000 ක් වැනි අඩු මුදලකට බදු දී තිබූ අතර, 2014 වර්ෂයේ ටෙන්ඩර් කැඳවා වැඩිම ලංසු මුදල වූ රු. 399,600 කට බදු දීමට තීරණය වුවද, එකී ටෙන්ඩර්කරු ඉදිරිපත් නොවීම හේතුවෙන් දෙවෙනි ටෙන්ඩර්කරුට රු. 342,000 කට බදු දී තිබුණි. අදාල බදුකරු 2014 පෙබරවාරි සිට අප්‍රේල් දක්වා බදු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, එකී හිඟ මුදල වූ රු. 94,050 ක් (ප්‍රමාද ගාස්තු 1% ක්ද ඇතුළුව) විගණන පරීක්ෂණ අවසථාව වූ 2015 මැයි මස වනවිටත් ගෙවා නොතිබූ අතර, එකී හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

2.3.6 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිට විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 මැයි මස වනවිට ත්‍රීරෝද රථ සංගම් 19 කින් ලියාපදිංචිය සඳහා අයදුම්පත් ලැබී තිබුණද, අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැසට් නිවේදනයක් මගින් ත්‍රීරෝද රථ ගාල් කිරීම් ගාස්තු උත්පාදනය කර ගැනීම සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2014 ජනවාරි 03 දිනැති අංක 1844 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය අනුව ප්‍රචාරණ දැන්වීම් සඳහා ගාස්තු නියම කර ප්‍රසිද්ධ කර තිබුණද, සභා බල ප්‍රදේශය තුල දැන්වීම් පිළිබඳ ප්‍රමාණවත් සමීක්ෂණයක් සිදුකර නියමිත ගාස්තු අය නොකිරීම හේතුවෙන් 2014 වර්ෂය වෙනුවෙන් රු. 23,960 ක් වැනි ඉතා සුළු ආදායමක් උත්පාදනය කර තිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශය තුල ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. 2014 පෙබරවාරි 03 දිනැති අංක 1844 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය අනුව, පනවා ඇති බදු 2014 අප්‍රේල් මස 01 දිනට පෙර සභාවට ගෙවිය යුතු වුවත්, එසේ සිදු නොවන අවස්ථා නිරීක්ෂණය විය. බදු ගෙවීම පැහැර හැරීම හෝ ප්‍රමාද කරන ආයතන පිළිබඳව උක්ත ගැසට් නිවේදනයේ සඳහන් පරිදි නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. සභාවට ලැබෙන ආදායම ලේඛණගත කිරීමක් පමණක් සිදුව ඇති අතර, හිඟ ආදායම් අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු
--------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 මැයි මස වනවිට 2014 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු රු. 831,292 ක උසාවි දඩ මුදල් අයවී නොතිබුණි.

(ආ) මුද්දර ගාස්තු වලට අදාලව උපලේඛණ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය මඟින් ගෙන්වා ගෙන නියමිත ආදායම් ගිණුම්ගත කල යුතු වුවත්, ඒ සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිටපු ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකු විසින් 2009 හා 2010 වර්ෂයන්හි බැහැර ගෙනගොස් ඇති අඟල් 02 ඩීසල් එංජින් 01 ක්, අඟල් 02 ඩීසල් එංජින් පොම්ප 01 ක්, අඟල් 2 හෝස් 01 ක්, ජී.අයි. නල 20 ක් සහ පෙති යකඩ 01 ක් විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 මැයි මස වනවිටත් සභාව වෙත භාරදී නොතිබුණි.

(ආ) තාවකාලික විශ්‍රාම වැටුප් වශයෙන් ලබා දී ඇති රු. 66,976 ක අත්තිකාරම් මුදල් විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 මැයි මස වනවිටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දේශීය ණය හා සංවර්ධන අරමුදලින් බැකෝ ලෝඩර් යන්ත්‍රය මිලදී ගැනීම සඳහා 2006 දෙසැම්බර් 21 දින ලබාගත් රු. 4,000,000 ක ණය මුදල් සම්බන්ධයෙන් 2011 සැප්තැම්බර් 30 දිනට වාරිකය සමඟ පොළිය රු. 244,627 ක්ද, 2002 නොවැම්බර් 05 දින පොදු වෙළඳපල සඳහා ලබාගත් රු. 1,500,000 ක ණය මුදලට අදාලව 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා

රු. 717,052 ක ණය වාරික හා පොළී මුදලක්ද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එකී ආයතනයට ගෙවීම සඳහා හිඟව පැවතුණි.

(ඇ) පල්ලෙගෙදර සම්භාණ්ඩ කර්මාන්ත ශාලාව සබරගමුව පළාත් සභාවේ සමුපකාර දෙපාර්තමේන්තුවෙන් 2014 ඔක්තෝබර් 30 දින සභාව වෙත පවරා දී තිබුණි. කර්මාන්ත ශාලාව පවරාදෙන අවස්ථාවේදී පැවති රු. 37,284 ක හිඟ විදුලි බිල නිරවුල් කර තිබුණද, භෞතික පරීක්ෂණය අවස්ථාව වූ 2015 මැයි 21 දින වනවිට විදුලි සම්බන්ධතාවය සපයා නොතිබුණි. තවද, මෙම කර්මාන්ත ශාලාව පවත්වා ගෙනයනු ලබන ඉඩම හා ගොඩනැගිල්ල සභාවට පවරා ගැනීමට විගණිත දිනය වනවිටත් කටයුතු කර නොතිබූ අතර, අදාල වත්කම ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි. සභාවට පවරා ගෙන මාස 07 ක් පමණ කාලයක් ගතවී තිබුණද, සක්‍රීය තත්වයට පත්කර එමඟින් ආදායම් උත්පාදනය කර ගැනීම සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් ආරම්භ කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා සීමාව තුල පිහිටි සුසාන භූමි අතරින් සුසාන භූමි 73 ක් පමණක් හඳුනාගෙන තිබුණද, එකී සුසාන භූමි අතරින් අක්කර 46 කට අධික වපසරයකින් යුත් සුසාන භූමි 57 ක් සම්බන්ධයෙන් මැනුම් කටයුතු සිදුකර සභාව වෙත විධිමත් ලෙස පවරාගෙන ලේඛණගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ වීථි ආලෝකකරණය සඳහා රු. 375,540 ක් වටිනා වීථි පහන් හා උපකරණ මිලදී ගැනීමේදී ඒ පිළිබඳ ප්‍රදේශය තුල සමීක්ෂණයක් සිදුකර වීථි පහන් අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන ප්‍රාදේශීය සභා තාක්ෂණික නිළධාරීගේ පූර්ව නිර්දේශය තොරව කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) සභාවේ වාහන පිළිබඳ ලේඛණයක් නිසි පරිදි නඩත්තු වී නොතිබූ අතර, සභාවේ එක් එක් වාහන සම්බන්ධයෙන් වගකීම විධිමත් පරිදි වාහනයේ ඉන්වෙන්ට්‍රිය සමඟ ලිඛිතව රියදුරුහට පවරා නොතිබුණි.

(ඇ) වාහන අළුත්වැඩියාව සිදු කිරීමට පෙර හා අළුත්වැඩියාවෙන් පසු අළුත්වැඩියාව නිසි ලෙස සිදු කල බවට කාර්මික නිළධාරියෙකුගේ සහතික කිරීමක් තිබිය යුතු වුවද, රු. 359,020 ක අළුත්වැඩියා සම්බන්ධයෙන් එසේ කටයුතු සිදුකර නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

-----------------------

(අ) පෞද්ගලික ආයතනයක් විසින් සංවිධානය කරන ලද දින 05 ක විදේශ සංචාරයක් සඳහා නිශ්චිත විධිමත් කැඳවීම් ලිපියකින් තොරව සහභාගී වී තිබූ සභාවේ සභිකයින් දෙදෙනෙකු වෙනුවෙන් සභා අරමුදලින් රු. 196,440 ක් ගෙවීම් කර තිබුණි. තවද, මෙම ගෙවීම්, මුදල් හා ක්‍රම සම්පාදන ලේකම් හා භාණ්ඩාගාර ලේකම්ගේ 2010 ඔක්තෝබර් 11 දිනැති අංක මු.ක්‍ර.අ. 01/2010/01 දරන චක්‍රලේඛයේ අංක 05 ඡේදය හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2010 සැප්තැම්බර් 09 දිනැති අංක PL/07/01/05/26 දරන චක්‍රලේඛයේ ඇතුලත් විධිවිධානයන්ට පටහැනි විය. ආණ්ඩුකාරවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව මෙම නිලධාරීන් විදේශ ගතවී තිබූ අතර, ගෙවා තිබූ රු. 79,500 ක්වූ අනියම් වියදම් සඳහාද බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල රු. 1,257,212 ක විවිධ භාණ්ඩ වර්ග මිලදී ගැනීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 ප්‍රකාරව සපයන ලද භාණ්ඩ නියමිත පිරිවිතරයන් හා වෙනත් එකඟ වූ නියමයන්ට අනුකූලද යන්න පරීක්ෂා කර නොතිබූ අතර, එම මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 ප්‍රකාරව විධිමත්ව පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවක ඇගයීමකට ලක්කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදි සුභසාධන කටයුතු සඳහා රු. 1,364,947 ක් වියදම් දරා තිබුණ අතර සුභසාධන පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් පූර්ව අවශ්‍යතා පිළිබඳ හඳුනාගැනීමක් සිදුකර ලේඛණගත කර ප්‍රතිලාභීන් තෝරා ගැනීම පිළිබඳව විධිමත් වැඩපිළිවෙලක් යටතේ භාණ්ඩ මිලදී ගැනීමක් සිදුකර නොතිබුණි. එකී සුභසාධන භාණ්ඩ බෙදාහැරීමෙන් පසු අදාල කාර්යය වෙනුවෙන් එම භාණ්ඩ යොදාගත් බවට නිසි පසුවිපරමක් සභාව විසින් සිදුකර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

අංක SG GX 4482 දරන ට්‍රැක්ටරය 2013 අගෝස්තු 23 දින සිට කුරුවිට සංවර්ධන, නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියට අළුත්වැඩියාව සඳහා භාර දී තිබූ අතර, 2015 වර්ෂයේදී එකී වාහනය අළුත්වැඩියා කිරීමට නොහැකි බව අධිකාරිය මඟින් දැනුම් දී ඇත. විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 මැයි මස වනවිටත් එකී වාහනය අක්‍රීය තත්ත්වයේ සහා භූමියේ ගාල් කර පැවතුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පළාත් පාලන අමාත්‍යාශ ප්‍රතිපාදන යටතේ හේන්යාය හරහා පිල්ල අසල ප්‍රධාන මාර්ගයේ සිට ඉලුක්බුළුවවත්ත දක්වා මාර්ගයේ දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීම සඳහා රු. 495,943 ක් ඇස්තමේන්තු කර තිබූ අතර, රු. 463,599 ක වියදමක් දරා තිබුණි. 2015 මැයි මස සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී මාර්ගය දෙපස පස් පුරවා මට්ටම් කර නොමැති බව නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

අයවැය පාලනය

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල වැය විෂයයන් 06 කට අදාල එකතුව රු. 289,000 ක ප්‍රතිපාදන කිසිඳු කාර්යයකට නොයොදා මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(ආ) අයවැයගත ප්‍රතිපාදන හෝ පරිපූරක සලසා ගැනීමකින් තොරව වැය විෂයයන් 08 කට අදාලව ප්‍රතිපාදන ඉක්මවා රු. 354,178 ක වියදම් දරා තිබුණි.

(ඇ) මනා සැලැස්මකින් යුතුව ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 04 ක් සම්බන්ධයෙන් රු. 1,545,228 ක ප්‍රතිපාදන අධි වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ඈ) වැය විෂයයන් අතරින් වැය විෂයයන් 03 කට අදාල ප්‍රතිපාදනයෙන් වෙනත් වැය විෂයයන්ට සියයට 30 සිට සියයට 97 ක් දක්වා මාරු කර ඇති අතර, ඉතිරි ප්‍රතිපාදන වලින්ද කිසිඳු වියදමක් දරා නොතිබුණි. මේ හේතුවෙන් අයවැය ලේඛණය සඵලදායි පාලන උපකරණයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලනඅ

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය